# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/73 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**මහනුවර ශ්‍රී වේළුවනාරාම පුරාණ විහාර පූජනීය ප්‍රදේශය පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය "මහනුවර ශ්‍රී වේළුවනාරාම පුරාණ විහාර පූජාභූමිය" යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

***මහනුවර ශ්‍රී වේළුවනාරාම විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

මිනින්දෝරු ජනරාල්ගේ 2013 සැප්තැම්බර් මස 16 වැනි දින අංක Maha/UDN/2013/1682 දරන සැලැසුමේ මධ්‍යම පළාතේ, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟ පලාත සුළු කොට්ඨාසයේ, කරමඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පහත දැක්වෙන A, B, හා C කොටස්වල දක්වා ඇති හෙක්ටයාර් 0.711 ක විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු ප්‍රදේශය.

*I කොටස*

කැබලි අංක **A**

| | | |
|---|---|---|
| උතුරට | : | පාර, ක.සි. 320249 කලාප 2 සහ ජේ.එම්. උපාලි ජයසූරිය හිමිකම් කියන වැරැල්ලහේන වත්ත ; |
| නැගෙනහිරට | : | ජේ.එම්.උපාලි ජයසූරිය හිමිකම් කියන වැරැල්ලහේන වත්ත සහ කැබලි අංක B ; |
| දකුණට | : | පාර සහ මාර්ගය ( ප්‍රාදේශීය සභා) ; |
| බස්නාහිරට | : | මාර්ගය ( ප්‍රාදේශීය සභා), සහ පාර. |

1A - G 20171 — 50 (2014/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*II කොටස*

**කැබලි අංක B**

| | | |
|---|---|---|
| උතුරට | : | ජේ.එම්. උපාලි ජයසුරිය හිමිකම් කියන වැරුල්ලහේන වත්ත සහ එස්.ටී.බී. යටිපත්තලාව හිමිකම් කියන වැරුල්ලහේන වත්ත ; |
| නැගෙනහිරට | : | එස්.ටී.බී. යටිපත්තලාව හිමිකම් කියන වැරුල්ලහේන වත්ත, ඩී.ඩී.යටිපත්තලාව හිමිකම් කියන වැරුල්ලහේන වත්ත සහ මාර්ගය ( ප්‍රාදේශීය සභා) ; |
| දකුණට | : | මාර්ගය ( ප්‍රාදේශීය සභා) ; |
| බස්නාහිරට | : | මාර්ගය ( ප්‍රාදේශීය සභා) සහ පාර. |

*III කොටස*

**කැබලි අංක C**

| | | |
|---|---|---|
| උතුරට | : | පාර සහ කැබලි අංක B ; |
| නැගෙනහිරට | : | කැබලි අංක B ; |
| දකුණට | : | කැබලි අංක B සහ මාර්ගය (ප්‍රාදේශීය සභා) ; |
| බස්නාහිරට | : | මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ පාර. |

09 - 496

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.